" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இல. / My No. | CSWP/ADM/30-38/FI/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025.03.28 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අංක DMT/H/VET/10-8 හා 2024.12.31 දිනැති ලිපිය බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.03.24 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2025 හා 2025.01.31 | 2025 රාමලාන් (රාමසාන්) සමයේදී විශේෂ නිවාඩු ලබා දීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2025 හා 2025.01.31 | ජල ගැලීම් / ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධාරීන් සඳහා නිවාඩු ලබා දීම - 2024 නොවැම්බර් |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2011 (i) හා 2025.01.29 | විනය පරීක්ෂණ සඳහා අවශ්‍ය ඡායාස්ථ පිටපත් ලබා දීමේදී අය කළ යුතු ගාස්තු |
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 හා 2025.01.20 | රාජ්‍ය නිලධරයන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය, නව මාර්ගගත තොරතුරු පද්ධතියක් ඔස්සේ සිදු කිරීම |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/2011(I)

මගේ අංක : EST-7/06/DIS/1000
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
කොළඹ 07

2025.01.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**විනය පරීක්ෂණ සඳහා අවශ්‍ය ඡායාස්ථ පිටපත් ලබා දීමේදී අය කළ යුතු ගාස්තු**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2011.10.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2011 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14:11 උප වගන්තියේ විධිවිධාන පරිදි චූදිත නිලධරයාගේ හෝ ඔහුගේ රැකවරණ නිලධරයාගේ හෝ ඉල්ලීම මත විනය පරීක්ෂණයට අදාළ ප්‍රකාශ, ලිපිලේඛනවල ඡායාස්ථ පිටපත් ලබා දීමේදී, උක්ත චක්‍රලේඛයෙහි 02 ඡේදයේ සඳහන් පරිදි අයකළ යුතු ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| කඩදාසියේ ප්‍රමාණය | පිටපත් ගාස්තු | |
|---|---|---|
| | තනි පැත්ත (රු.) | දෙපැත්ත (රු.) |
| A4 | 8.00 | 11.00 |
| B4 | 12.00 | 14.00 |
| Legal | 10.00 | 13.00 |

03. මෙම සංශෝධන 2025.02.01 දින සිට ක්‍රියාත්මක වේ.

04. මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2697233
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vii@pubad.gov.lk